# 1930 දශකයේ දේශපාලන බලවේගයක් ලෙස වාමාංශික ව්‍යාපාරය

*අයි.ආර්.ජී.ඩී.ජේ.කේ. ඉහළගෙදර* [1]

***ABSTRACT***

***Sri Lanka's leftist movement has started the beginning of 30th century. The main sources of this movement were rural upper middle class and the children of small scale industry owners. They all pursued their higher education from England and America, and they were influenced by the Marxist ideology and came to Sri Lanka. Before they pursued foreign education they were influenced by the Buddhist reawakening movement. In this paper, we discuss the real picture from which these young crowds were influenced and in what form their thought took place. It is also important to analyze domestic political environment was formed to start their political life.***

***Sri Lankan student community and the Indian student community worked very closely among the other students communities who studied in England. They all were disappointed with the British Labor Party. Therefore, the British Communist Party and the leftist wing of the Labor Party had a clear picture of the Sri Lankan and Indian students' communities. It became a firm bond as two leaders of British communist Party were Indians. Two Sri Lankan students, Philip Gunawardane and Lesly Gunawardane were the members of Indian communist students' society in London. Most of the Sri Lankan students had privilege to learn deeply on socialist thinkers and the theoretical knowledge on Marxism. They all worked as members of the British Communist Party and could able to get the practical knowledge on leftist politics.***

---

[1] **Mr. IRGDJK Ihalagedara, Lecturer (Prob) BA (Hons) in History (PDN) MA (PDN) Modern *History*. Department of Humanities E-mail: ihalagedara@yahoo.com**

## හැඳින්වීම (Introduction)

ශ්‍රී ලාංකික දේශපාලන සංදර්භය තුළ දේශපාලන පක්ෂ විසින් කරනු ලබන කාර්යභාරය කීප ආකාරයකට එනම් සමාජ සංවර්ධනයෙහි ලා විවිධ අංශයන් හා බැඳී පවතින්නකි. දේශපාලන ස්වාධීනත්වය ලැබීමත් සමඟ මෙරට ට ලැබුණු ඩොමීනියන් ආණ්ඩු ක්‍රමය පෙරට ගෙන යාමේ යාන්ත්‍රනයක් ලෙස දේශපාලන පක්ෂ ක්‍රමය මෙරටෙහි ස්ථාපිත වූ බව පැහැදිලි කරුණකි. එහෙත් එම අරමුණ වෙනුවෙන්ම පිහිටවා ගනු ලැබූ සංවිධිත දේශපාලන පක්ෂවලට වඩා ඈතට විහිදුණු එනම් පූර්ව නිදහස් අවදිය දක්වා දිගු ඉතිහාසයකට උරුමකම් කිව හැකි දේශපාලන පක්ෂයක් ලෙස 1935 දී පිහිට වූ ලංකා සම සමාජ පක්ෂය හැඳින්විය හැකිය. ලංකා සම සමාජ පක්ෂය ආරම්භ කිරීම මෙරට වාමාංශික ව්‍යාපාරයෙහි ලා ඉතා වැදගත් සන්ධිස්ථානයකි.

යටත් විජිත පාලකයින් පිළිබඳව පැවති විරෝධය විවිධ ස්වේච්ඡා සහ ජාතික ව්‍යාපාරයන් මගින් ප්‍රකට වෙද්දී එය හුදෙක් දේශපාලන පක්ෂයක විරෝධයක් බවට පත් කරන ලද්දේ 1935 පිහිට වූ ලංකා සම සමාජ පක්ෂය මගිනි. 1935 දී එකම ධාරාවක් ලෙස ඇරඹි වාමාංශික ව්‍යාපාරය අවුරුදු කීපයක් ගත වන විට විවිධ ධාරාවන් ඔස්සේ විභේදනයන්ට ලක් වෙමින් ගමන් කරනු පෙනී යයි. වාමාංශික ව්‍යාපාරය පිළිබඳව අධ්‍යයනයක දී සමස්ත විභේදනයන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් කරුණකි. මේ තුළින් මෙරට වාමාංශික ව්‍යාපාරය කෙරෙහි පූර්ණ අවබෝධයක් ලබාගත හැකි වේ.

## 1930 දශකයේ දේශපාලන බලවේගයක් ලෙස වාමාංශික ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ඉතිහාසය ඇරඹෙනුයේ 1930 දශකයේ ආරම්භයත් සමඟය. වාමාංශික ව්‍යාපාරයේ මූලිකත්වය ගනු ලැබුයේ මෙරට ග්‍රාමීය ප්‍රභූ පවුල්වල සහ නාගරික සුළු වෙළඳුන්ගේ දූ පුතුන්ය. මොවුන් සියලු දෙනාම පාහේ එංගලන්තයේ හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය ලබා එම රටවලදී මාක්ස්වාදයේ අනුගාමිකයන් වී මෙරටට පැමිණි අයයි. විදේශ අධ්‍යාපනය ලැබීමට පෙර මොවුහු සිංහල බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ ආභාසයට ලක්වී සිටියහ. (jayawardena ,1976)

අප මෙහිදී අවධානය යොමු කළ යුතු වන්නේ මෙම තරුණ පිරිස් සාමාජවාදය වැළඳ ගැනීම සඳහා මෙහෙය වූ සමකාලීන බලවේග හා චින්තන කුමන ස්වරූපයක් ගනු ලැබූවේද, යන්න පිළිබඳවයි. එමෙන්ම

මෙලෙස උසස් අධ්‍යාපනය ලද තරුණ පිරිස් මෙරටට පැමිණීමෙන් පසු ඔවුන්ට ස්වකීය දේශපාලන ජීවිතය ඇරඹීමට මෙරට පසුබිම සකස් වී තිබූ ආකාරයත් විමසීම වැදගත් වේ. එන්ගලන්තයේ උසස් අධ්‍යාපනය සඳහා ගොස් සිටි ශිෂ්‍ය කණ්ඩායම් අතර ශ්‍රී ලාංකික ශිෂ්‍ය කණ්ඩායමත් ඉන්දීය ශිෂ්‍ය කණ්ඩායමත් බොහෝ සමීපව කටයුතු කළහ. මොවුහු සියලු දෙනාම බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂය සම්බන්ධයෙන් දැඩි කලකිරීමකට පත්ව සිටියහ. (ජයවර්ධන,1976) මෙයට හේතු වූයේ බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂය විජිත පිළිබඳ ප්‍රශ්නවලදී දැඩි අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයි. මේ හේතුව මත ශ්‍රී ලාංකික හා ඉන්දිය ශිෂ්‍ය කණ්ඩායම් අතර බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේත්, කම්කරු පක්ෂයේ වාමාංශික කොටස් කෙරෙහි පැහැදීමක් ඇති විය. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ නායකයන් දෙදෙනෙකු ඉන්දීයයන් වීම (ප්‍රනාන්දු,1974:7) හේතු කොට ගෙන මේ බැඳීම තවත් වැඩි විය.

ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් දෙදෙනකු වූ පිලිප් ගුණවර්ධන හා ලෙස්ලි ගුණවර්ධන ලන්ඩනයේ ඉන්දියානු කොමියුනිස්ට් ශිෂ්‍ය කණ්ඩායමට බැඳී සිටියහ. ලාංකීය සිසුන් වැඩි පිරිසක් ස්වකීය විශ්වවිද්‍යාලවල සාමාජවාදී ආචාර්යවරුන් සහ මාක්ස්වාදය පිළිබඳව න්‍යායික අවබෝධයක් ලබා ගැනීමට හැකිවිය. එලෙසින් බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් ලෙස කටයුතු කිරීමත් හේතු කොටගෙන ප්‍රායෝගික ලෙස වාමාංශික කටයුතුවල නිරත වීමට හැකි විය.

ලාංකික ශිෂ්‍යයින් අතර වූ 'ලංකා ශිෂ්‍ය සංගමය' සමාජවාදී දේශපාලන සාකච්ඡා පැවැත්වීමේ වැදගත් මධ්‍යස්ථානයක් බවට පත්විය. මොවුන් මෙහිදී සමාජවාදී ප්‍රශ්න සම්බන්ධව කරුණු සාකච්ඡා කළ අතර, ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂයක් පිහිටුවීමේ අවශ්‍යතාව පිළිබඳව සාකච්ඡා පැවැත්වීම ඉතා වැදගත් වේ. මෙම කණ්ඩායමට පිලිප් ගුණවර්ධන, ලෙස්ලි ගුණවර්ධන, කොල්වින් ආර්. ද සිල්වා, ඇන්. ඇම්. පෙරේරා. සහ දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ ද ඇතුළත් වූහ. (goonawardena,1960:15)

මෙම ශිෂ්‍ය කණ්ඩායම කෙරෙහි ඉතා වැදගත් වූ බලපෑමක් වූයේ සමාජවාදය හා අධිරාජ්‍ය විරෝධී අරගලය අතර වූ සබඳතාවයි. මේ සඳහා ඉන්දීය ජාතිවාදී ව්‍යාපාරයෙහිත් මාක්ස්වාදයෙහිත් ආභාසය ලැබීම වැදගත්වේ. මේ කාල වකවානුවේ ලන්ඩන්හි අධ්‍යාපනය හැදෑරූ ඉන්දීය ශිෂ්‍යයෝ ජාතිකවාදී උද්ඝෝෂණවල යෙදී සිටියහ. මෙය දැඩි බලපෑමක් වූයේ ඉන්දීය ජාතික සංගමය විසින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වර්ජනය කිරීමයි. මෙලෙස ලන්ඩන්හි අධ්‍යාපනය ලැබූ ජාතික තරුණ පිරිස් සමාජවාදී චින්තනය කෙරෙහි නැඹුරු වූ අතර, මොවුහු ස්වකීය අධ්‍යාපනය නිමවා මෙරටට පැමිණීමෙන් පසු දේශපාලන ජීවිතය ඇරඹූහ. මෙලෙස සමාජවාදී හා අධිරාජ්‍ය විරෝධී චින්තනයෙන් පෝෂණය ලද

මොවුන් දේශපාලන ජීවිතය ඇරඹීම මෙරට වාමාංශික ව්‍යාපාරයේ ආරම්භක අවස්ථාවයි.

මෙම තරුණ සමාජවාදීහු ප්‍රථමයෙන්ම තරුණ සංගම් ව්‍යාපාරය තුළත්, ඉන් පසු "සූරියමල් ව්‍යාපාරය තුළත්" * කම්කරු පන්ති ව්‍යාපාරය තුළත්, ස්වකීය දේශපාලන කටයුතු ඇරඹූහ. මෙය සංවිධානාත්මක වාමාංශික ව්‍යාපාරයේ මූලාරම්භයයි.

මෙරට වාමාංශික ව්‍යාපාරය සාර්ථක ලෙස වර්ධනය වීම සඳහා හේතු වූ සාධක පිරික්සීම වැදගත් වේ. මේ සඳහා දේශීය පසුබිම කෙලෙස සකස් වී තිබුනේ ද? යන්න පිළිබඳ අවධානය යොමුකළ යුතු වේ.

සමකාලීන ලෝක ධනේශ්වර ආර්ථිකයේ ඇති වූ මහා ආර්ථික අර්බුදය ඉතා වැදගත් වේ. එය ලංකාව කෙරෙහිද දැඩි ලෙස බලපෑවේය. ලංකා ආර්ථිකය රඳා පැවති තේ, පොල්, රබර් වගාවන් කෙරෙහි බෙහෙවින් ආර්ථික අර්බුදය බලපෑ අතර, එමගින් එකී නිර්යාතවල මිල ඉතා විශාල ලෙස පහත වැටුණි. අර්බුදය ඉතා උත්සන්න වූ අවස්ථාවේ දී මෙරට නිර්යාත ආදායම මුළු වාර්ෂික ආදායමෙන් 36% කින් පහත වැටුණි.

මේ හේතු කොටගෙන මෙතෙක් ආණ්ඩුව විසින් අනුගමනය කරන ලද පොදු වැඩ කටයුතු බෙහෙවින්ම සීමා කරන ලදී. මහාමාර්ග තැනීම නතර කළ අතර, සෞඛ්‍යය සේවාව ඇතුළු අත්‍යාවශ්‍ය සේවා රැසක් කපා හැරුණි. රබර් කර්මාන්තය විනාශකාරී ලෙස පහත වැටුණි. වතුකරයේ රැකී රක්ෂා හිඟය ඉතා උග්‍ර වූ අතර ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා පෞද්ගලික කර්මාන්ත ශාලාවලින් ද විශාල ලෙස සේවකයෝ ඉවත් කරන ලදහ.

මෙම මහා ආර්ථික අර්බුදයේ විපාක සහගත ප්‍රතිඵලය වූයේ අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල දැරිය නොහැකි ලෙස ඉහළ යාමයි. මෙම තත්ත්වය මිනිසුන්ගේ අගහිඟකම් වැඩිකළ අතර, ඉතා දුක්ඛිත තත්වයකට පත් වීමට හේතු විය. සෘජු බදු වෙනුවට වක්‍ර බදු අය කළ අතර, මෙයින් දුප්පතාගේ තත්ත්වය තව තවත් ප්‍රපාතයට පත් විය. මහා ආර්ථික අර්බුදය මගින් ධනවාදයේ අස්ථිර බවත් කුරිරු බවත් මැනවින් පෙන්නුම් කරන බව මාක්ස්වාදීහු පෙන්වා දුන්හ. වාමාංශික ව්‍යාපාරයට තමන්ගේ ආර්ථික සටන් පාඨ ඉදිරිපත් කිරීමට හා ඒ මඟින් ජනතාව දිනා ගත හැකි වූයේ මෙම පසුබිම මතයි.

ආර්ථික අර්බුදය මාධ්‍යයේම මෙරට ඉතා දරුණු වසංගතයක් වූ 'මැලේරියා වසංගතය' ඇති විය. මෙමඟින් 1935-1937 අතර කාලයේ මිනිසුන් 125000 කට ආසන්න ප්‍රමාණයක් මරණයට පත්වූ බව සංඛ්‍යා

ලේඛනවලින් පෙනී යයි. මැලේරියා වසංගතය ආණ්ඩුවේ ප්‍රතිපත්ති විවේචනය කිරීමට යොදාගත් ප්‍රධාන වේදිකාවක් බවට පත් විය. මෙමඟින් මහජනයා හා සබඳතා ගොඩනඟා ගැනීමට වාමාංශික ව්‍යාපාරයට විශාල ලෙස ප්‍රයෝජනවත් විය. ස්වකීය දේශපාලන අදහස් ප්‍රචාරය කිරීමට ඉතා සූක්ෂම ලෙස ප්‍රයෝජනයට ගන්නා ලදී. මේ සමඟම ඔවුහු සහනාධාර සැපයීමේ ව්‍යාපාරයට ප්‍රමුඛත්වය දී කටයුතු කළහ.

1934 ඔක්තෝබර් වන විට කෑගල්ල හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වලින් පටන්ගත් වසංගතය අන් දිස්ත්‍රික්කවලටත් පැතිරිණි. ආර්ථික අර්බුද සමයේ දී රටේ සුභසාධක සේවා කපා හැරීම මේ තත්වයට හේතු වූ බව වාමාංශික නායකයෝ පෙන්වා දුන්හ. නමුත් මේ පිළබඳව විමසා බැලීමේදී ස්වාභාවික හේතු ද දැඩි ලෙස බලපෑ බව පෙනී යයි. පොදු සේවා කපා හැර තිබීමේ තත්ත්වය වඩා උග්‍ර විය. අධිරාජ්‍යවාදීන්ගේ සූරාකෑම තුළින් බිහිවන මන්දපෝෂණය 'මැලේරියා වසංගතයේ' පසුබිම වන බව වාමාංශක නායකයෝ පෙන්වා දුන්හ. වාමාංශික නායකයෝ සත්‍ය සමාජ සේවකයන් ලෙස සහනාධාර සැපයීමේදී ප්‍රමුඛත්වය ගත්හ. මෙහිදී පිලිප් ගුණවර්ධන, ඇන්. එම්. පෙරේරා, දොස්තර ඇස්. ඒ. වික්‍රමසිංහ ආදීහු ජනතා හිතවතුන් සහ සමාජ සේවකයින් ලෙස විශාල ජනප්‍රියත්වයක් දිනා ගත්හ. මෙම ජනප්‍රියත්වය 1936 මැතිවරණය කෙරෙහි සෘජු වශයෙන්ම බලපෑමක් ඇති කිරීමට සමත්විය. හෝමාගම සිට රුවන්වැල්ල දක්වා ප්‍රදේශය සහනාධාර සැපයීමේ කේන්ද්‍රය වූ අතර මෙම ප්‍රදේශය මෙරට වාමාංශික ව්‍යාපාරයේ බලකොටුව බවට පත්වීම තුළින් මේ තත්වය වටහා ගත හැකිය.

වාමාංශික ව්‍යාපාරය පුළුල් වීමටත්, මහජන ශක්තිය ලැබීමටත් එක් හේතුවක් වූයේ මෙම මැලේරියා සහනාධාර ව්‍යාපාරයයි. මෙය මෙරට වාමාංශික ව්‍යාපාරයේ සංඛ්‍යාත්මක වර්ධනයක් ඇති කළේය.

වාමාංශික ව්‍යාපාරයේ නායකයින් ස්වකීය කාර්යයන් අතුරින් ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙනු ලැබුයේ සූරියමල් ව්‍යාපාරයටයි. අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයක් සඳහා සමාජයේ බහුතර දායකත්වයක් ලබාගෙන ඔවුන්ගේ අධිරාජ්‍ය විරෝධී හැඟීම් ප්‍රචලිත කිරීමට මෙකී ව්‍යාපාරය උපයෝගී කරගන්නා ලදී. සේවාමුක්ත හටයන් උදෙසා ඇරඹි සූරිය මල් ව්‍යාපාරය, එහි අරමුණ වූ දුබලතාවට පත් වූ ලාංකික සෙබළුන්ගේ සුභසාධනය සැලසීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් බැහැර වීමක් පෙනී යයි. සූරියමල් ව්‍යාපාරය දේශපාලනමය වූ අධිරාජ්‍ය විරෝධී ස්වරූපයක් ගනු ලැබීය. (muthias,1996:33)

සූරියමල් ව්‍යාපාරයේ වැදගත්කම රඳා පැවතියේ පූර්ණ නිදහස උදෙසා ගෙන ගිය උද්ඝෝෂණ ප්‍රචාරක මධ්‍යස්ථානයක් බවට පත්වීමේ හේතුවෙනි. මෙකී ව්‍යාපාරයෙහි ප්‍රථමවරට සමාජවාදය පිළිබඳව සඳහන් කරන ලද්දේ 1933 දී ටෙරන්ස් සිල්වා විසින් ලියන ලද "සූරිය මලද පොපි

මලද" මැයෙන් වූ ලිපියෙනි. මින් පසු වාමාංශික ව්‍යාපාරයේ අදහස්වලට නතුවීම සිදුවිය. මෙලෙස වාමාංශික ව්‍යාපාරය මෙරට සමාජය තුළ ස්ථාපිත වීම සඳහා පැවතියා වූ හා නිර්මාණය කළා වූ ද බලවේග ඉතා සාර්ථක ලෙස ඒකරාශී කරවීමක් දැකගත හැකිය. වාමාංශික ව්‍යාපාරය මෙරට ආරම්භ වන විට ප්‍රධාන දේශපාලන සංවිධාන දෙකක් ක්‍රියාත්මක විය. එනම්,

01. 1919 දී පිහිට වූ ලංකා ජාතික සංගමය

02. 1928 දී බිහි වූ ලංකා කම්කරු පක්ෂය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කොලීජිය 1921 දී ආරම්භවීම මෙරට තරුණ ව්‍යාපාරයේ ඉතා වැදගත් අවස්ථාවකි. මින් බිහි වූ වැඩි පිරිසක් ජාතික සංගමයේ නායකත්වය කෙරෙහි කළකිරීමකින් පසු විය. ලංකා ජාතික සංගමය ප්‍රමුඛ ජාතික ව්‍යාපාරයෙහි නායකත්වය නියෝජනය කරනු ලැබුවේ මෙරට ධනේශ්වර පන්තියේ අදහස් උදහස්ය. ජාතික සංගමයේ නායකයින් මුල් අවස්ථාවේ දී යම් ප්‍රමාණයකට මෙරට කම්කරු පන්තිය හා ගොවීන් වෙනුවෙන් කතා කළ ද පසුකාලීනව මෙහි වෙනසක් දක්නට විය.

ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙන් බිහිවූ තරුණ පිරිස් වඩා පක්ෂපාතීත්වයක් දක්වනු ලැබුයේ ඒ.ඊ. ගුණසිංහයන්ගේ "කම්කරු පක්ෂය" වෙතය. නමුත් මෙය සමාජවාදී නැඹුරුවක් තිබූ ව්‍යාපාරයක් නොවීය. එය ජාතික රැඩිකල්වාදී ව්‍යාපාරයක් විය. මෙරට හා විදේශීය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය ලද බොහෝ තරුණ පිරිස් සමාජවාදී අදහස් දැරූ අතර මෙය හේතු කොටගෙන මෙකී තරුණ කොටස් කම්කරු පක්ෂයෙන් ද වඩා ස්වාධීන වූ රටාවක ගමන් කරනු දැක ගත හැක. ඒ.ඊ. ගුණසිංහගේ කම්කරු පක්ෂය කෙරෙහිත් ඔහුගේ ප්‍රතිපත්ති කෙරෙහිත් විරුද්ධවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ කම්කරු සංගමය පිළිගැනීමට ප්‍රති උපකාරයක් ලෙස හදිසි වැඩවර්ජන නොකරන බවට කැමති වෙමින් කම්කරු සංගමය 1929 දී සේව්‍යයන් සමඟ සාමූහික ගිවිසුමක් අත්සන් කිරීමයි. (ප්‍රනාන්දු,1974:140)

මේ හේතු කොට ගෙන 1930 දශකයේ මුල ගොඩ නැගුණු සමස්ත ලංකා තරුණ සම්මේලනය වඩා ස්වාධීන වූ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු දැක ගත හැක. මේ තරුණ පිරිස්හි වඩා සංවිධානගතව සිටියේ යාපනය තරුණ සංගමය හා කොළඹ තරුණ සංගමයත්ය. මෙම තරුණ සංගම් පිරිස් වෘත්තීය සංගම් ක්ෂේත්‍රය කෙරෙහි නැඹුරුවීමක් දැක ගත හැක. 1933 වැල්ලවත්ත රෙදි මෝලේ ඇති වූ වැඩවර්ජනය ඉතා වැදගත් සිදුවීමකි. මෙම වැඩවර්ජනයේ දී නායකත්වය තරුණ සම්ගම්හි සාමාජිකයෝ ගනු ලැබූහ. (ලයනල් සරත්) ඒ.ඊ. ගුණසිංහගේ කම්කරු සංගමය මින් පසු වෘත්තීය සමිති ක්ෂේත්‍රයෙහි ලා බෙහෙවින් බලපෑ සාධකයක් විය.

මින් පසුව වැල්ලවත්ත රෙදි මෝලෙහි කම්කරුවන් ඒ.ඒ. ගුණසිංහගේ නායකත්වය කෙරෙහි කලකිරීමෙන් නව සංවිධානයක් ගොඩනැගීම කෙරෙහිත්, නව නායකත්වයක් කෙරෙහිත්, නැඹුරුවිය. මේ අවස්ථාවේදී ඔවුන් අතර නායකත්වය ගැනීමට වාමාංශික ව්‍යාපාරයේ නායකයින් වූ කොල්වින් ආර් ද සිල්වා හා වර්ණන් ගුණසේකර යන දෙදෙනාට හැකිවීම වාමාංශික ව්‍යාපාරයෙහිලා වැදගත් සිදුවීමක් විය.

මීට පෙර සඳහන් කළ ආකාරයට තරුණ සම්මේලනයේ ඒකරාශිවී සිටියේ ජාතික සංගමයේ හා කම්කරු පක්ෂයේ ප්‍රතිපත්තීන් පිළිබඳව නොසෑහීමකට පත්ව සිටි පිරිසකි. මේ හේතුවෙන් මෙහි පැහැදිලි ප්‍රතිපත්තියක් හෝ ඉදිරි දර්ශනයක් නොවීය. මේ පසුබිම මත 1932 පමණ වන විට තරුණ සංගමය අඩ පන වූ ව්‍යාපාරයක් බවට පත් විය. වාමාංශික ව්‍යාපාරයේ ප්‍රමුඛ නායකයකු වූ පිලිප් ගුණවර්ධනගේ ප්‍රධාන අරමුණ වූයේ මෙලෙස අඩපන වූ තරුණ ව්‍යාපාරය ඔහු අතට ගෙන එය නැවත නගා සිටුවීමයි. මෙකී පරමාර්ථය උදෙසා ක්‍රියාත්මක වූ පිලිප් ගුණවර්ධන එය සාර්ථක කරගනු ලැබුවේ 'දකුණු කොළඹ තරුණ සමිතිය' ස්වකීය වාමාංශික ව්‍යාපාරයට සම්බන්ධ කරගැනීමෙනි.

මේ අන්දමට ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය ක්‍රමක් ක්‍රමයෙන් ස්ථාවර තත්වයකට පත්වෙනු දක ගත හැක. මෙවන් පසුබිමක් මත අධිරාජ්‍ය විරෝධී අරගලයකට මෙන්ම කම්කරු පන්ති ව්‍යාපාරයකට ද දේශපාලන හා වෘත්තීය සමිති උද්ඝෝෂණයක් කරගෙන යාම සඳහා නායකත්වය සැපයීමට හැකි ආකාරයේ තනි දේශපාලන පක්ෂයක අවශ්‍යතාව ඉතා දැඩිව දැනෙන්නට විය. මෙය වඩා තීව්‍ර වූයේ නගරබඳව සහ වතුකරයේ ධනපති ක්‍රමයට එරෙහිවීමට හෝ සටන් කිරීමට හැකි පක්ෂයක් හෝ කම්කරු ව්‍යාපාරයක් නොතිබීම හේතුවෙනි. මෙවන් පසුබිමක් මත වාමාංශික ව්‍යාපාරය සංවිධානාත්මක දේශපාලන ව්‍යාපාරයක් ලෙස දේශපාලනයට පිවිසෙනු දක ගත හැක. (දිසානායක,1992:11) ඒ 1935 දෙසැම්බර් 18 වන දින ලංකා සමසමාජ පක්ෂය බිහිවීමෙනි. මෙය ලංකාවේ පළමු වාමාංශික දේශපාලන පක්ෂය විය. (sanmugathasan,1972:3)

මෙලෙස ලංකා සමසමාජ පක්ෂය පිහිටුවීම සඳහා ක්‍රමයෙන් ගොඩනඟාගන්නා ලද පසුබිමක් හේතු වූ අතර ආසන්නම හේතුව වූයේ 1936 පෙබරවාරි හා මාර්තුවලදී රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා දෙවන මහ මැතිවරණය පැවැත්වීමට තීරණය කර තිබීමයි. ලංකා සමසමාජ පක්ෂයේ සභාපති ලෙස කොල්වින් ආර් ද සිල්වා ද සහ එහි ලේකම් ලෙස වර්ණන් ගුණසේකර ද තේරී පත් වූහ.

ලංකා සම සමාජ පක්ෂයේ ආරම්භක ක්‍රියාමාර්ගය විප්ලවවාදී හෝ මාක්ස්වාදී නොවීය. සමාජ ක්‍රමය පරිවර්තනය විය යුතු බවට අදහසක් සහ අරමුණක් සමසමාජ පක්ෂයේ ක්‍රියාමාර්ග තුළ අඩංගු විය. නමුත්

සමාජ විප්ලවයක් පිළිබඳ ක්‍රියාමාර්ගයක් එහි ඉදිරි ක්‍රියාමාර්ග තුළ අඩංගු නොවීය. මේ නිසා සමසමාජ පක්ෂය සමාජවාදී පක්ෂවලට සමාන නොවීය. සමසමාජ පක්ෂයේ මුල් ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමේදී ඉතා පැහැදිලිව පෙනී යන්නකි, අධිරාජ්‍ය විරෝධී ස්වභාවය.

පක්ෂය තුළ දෘෂ්ටිමය ඒකාග්‍රතාවක් නොවීය. නායකයින් එකිනෙකා අතර පරස්පර විරෝධී වූ අදහස් විය. 1935 දී පක්ෂය පිහිටුවීමට මූලිකත්වය දුන් පස් දෙනෙකුගෙන්** සමන්විත වූ කවයක් විය. මෙම කවය "ටී" කණ්ඩායම ලෙස හැඳින්විණි. (වන්‍යසේකර,1977:9) "ටී" අක්ෂරයෙන් මෙලෙස හැඳින්වූයේ ලියොන් ට්‍රොට්ස්කිගේ නාමේ මුලකුර වූ "ටී" අක්ෂරය මුල් කරගෙනයි. මෙයින් පෙනී යන්නේ ලංකා සම සමාජ පක්ෂය මුල පටන්ම ට්‍රොට්ස්කිගේ අදහස්වලින් ආභාසයක් ලැබූ බවයි.

එමෙන් ම පිලිප් ගුණවර්ධන ස්වකීය අධ්‍යාපන කටයුතු නිමවා ලංකාවට පැමිණෙන අතර තුරදී ප්‍රංශයේ හා ස්පාඤ්ඤයේ ට්‍රොට්ස්කිගේ අදහස් හා සම්බන්ධව කටයුතු කළ කණ්ඩායම් සමඟ සබඳතා පවත්වා ඇත.

එමෙන්ම දොස්තර ඇස්. වික්‍රමසිංහ 1936 අගෝස්තු 26 දා එන්ගලන්තය බලා පිටත්ව යාම වැදගත් සිදුවීමකි. මෙහිදී ඔහු බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය හා ඉතා සමීපව කටයුතු කළේය. ඔහු ලන්ඩනයේ සම සමාජ නායකයා ලෙස කටයුතු කළ අතර, එවකට ශිෂ්‍යයන් ලෙස ලන්ඩන්හි අධ්‍යාපනය ලැබූ ඒ වෛද්‍යලිංගම් හා පීටර් කෙනමන් ඇසුරු කරමින් ඔවුන් හා සබඳතාද වර්ධනය කරගත්තේය. දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ පෙරළා මෙරටට පැමිණ ලංකා සම සමාජ පක්ෂයේ නායකයෙකු ලෙස සිය කාර්ය කරගෙන ගියේය. මේ වන විට පක්ෂයේ මෝරමින් ආ ඇතැම් මතවාද උග්‍ර තත්වයකට පත්ව තිබුණි. ලංකා සමසමාජ පක්ෂය අභ්‍යන්තරයේ දේශපාලන මතවාදී අරගලයක් මතුවිය. මෙම මත අරගලය සෝවියට් දේශයේ නායකයා වූ ජෝෂප් ස්ටාලින් හා තවත් ප්‍රමුඛ පෙළේ නායකයෙකු වූ ලියොන් ට්‍රොට්ස්කි අතර හට ගන්නා ලද මත භේදයන් මුල් කරගෙන ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය කෙසේ සකස් විය යුතුද ? යන මතභේදය මත ඇති වූවකි.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (References)*

වන්‍යසේකර, රංජිත් .(1977). **සම සමාජය සහ බොල්ෂවික් වාදය 1935- 1950,** කුරුණෑගල: නාවින්න ප්‍රකාශන.

ජයවර්ධන, කුමාරි. (1976). **ලංකාවේ වාමාංශික ආරම්භය 1930-1935,** කොළඹ: මහජන අධ්‍යාපන ප්‍රකාශන.

ප්‍රනාන්දු, ලක්සිරි. (1974).**ජාතික ව්‍යාපාරය, ව්‍යවස්ථා වර්ධනය හා වාමාංශික ව්‍යාපාරයේ උපත** , නුගේගොඩ: දීපානි ප්‍රකාශන.
ලයනල් ,සරත්. **ලංකාවේ කම්කරු පන්ති අරගලය මෑත යුගයේ කතා පුවත.**

දිසානායක,වසන්ත.(1992). **ශ්‍රී ලංකාවේ වමේ ව්‍යාපාරය විශ්ලේෂණාත්මක ප්‍රවේශයක්**, කොළඹ: ජනතා ක්‍රියාකාරීත්වය සඳහා අධ්‍යයන හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන.

Goonawardane, Lesli. (1960). **A Short History of the Lanka Sama Samaja party**, Colombo: Trotskysim and stalinsm

Jayawardena, Kumari. **The Orignis of the Left Movement in Sri Lanka**, Colombo: Sanjeewa Book s.

Muthias S, Wesly. Wajesinghe, Sidney. (1996). **Britain World War 2 and the Samasamajaista**, Colombo: Aoung Socialist Publication.

Sanmugathasan, N. (1972).**A Short History of the Left Movement in Ceylon**, Colombo: Published in Europe.

* සූරිය මල් ව්‍යාපාරය. නොවැම්බර් 11 වන දින ලෝක යුද්ධ සමාදාන දින සිහිවීමට පොපි මල් විකිණීමට එරෙහිව ආරම්භ කළ ව්‍යාපාරයයි.

** ලෙස්ලි ගුණවර්ධන, එන්.එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, කොල්වින් ආර් ද සිල්වා සහ රොබට් ගුණවර්ධන